# ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයේ මෑත කාලීන ප්‍රවණතා

එච්.යූ. ගීතාංජලී, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
u.geethanjalee@gmail.com

**සංක්ෂේපය**

වර්තමානය වන විට ලෝකයේ සැලකිය යුතු රටවල් ප්‍රමාණයක මැණික් කර්මාන්තය ප්‍රචලිත ව පවතින අතර, ආසියානු මැණික් කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. මැණික් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය සලකා බැලීමේ දී මැණික් අපනයනය, අපනයන වෙළෙඳපොළ, බලපත්‍ර නිකුත් කිරීම, මෙම කර්මාන්තය හා සම්බන්ධ ආයතන, සේවා නියුක්ති ස්වභාවය, කර්මාන්තය ආශ්‍රිත ගැටලු හා ඒවා අවම කිරීම යන තත්ත්වයන් වැදගත් වේ. මෙම ලිපියෙන් අපේක්ෂා කරන්නේ මැණික් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය හඳුනා ගැනීමත්, එමඟින් ආර්ථිකයට දක්වන දායකත්වය හා ඒ ආශ්‍රිත ගැටළු හඳුනාගැනීමත් ය. මෙහි දී පොත්පත්, සඟරා, ආයතනික සංඛ්‍යාලේඛන ආදී ද්විතීයික මූලාශ්‍ර යොදාගෙන ඇත. සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට මැණික් කර්මාන්තය තුළින් විශාල දායකත්වයක් හිමිවන බවත්, මැණික් කර්මාන්තය ආශ්‍රිතව ගැටළු පවතින අතර, ඒ සඳහා ආයතනික ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් හා කර්මාන්තයේ ප්‍රගමනය සඳහා එම ආයතන කටයුතු කරන බවත් දැකගත හැකි ය.

**මුඛ්‍ය පදඃ** ශ්‍රී ලංකාව, මැණික් කර්මාන්තය

## හැඳින්වීම

ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුව ත් එහි ස්වාභාවික හා සෞන්දර්යාත්මක වැදගත්කම නිසා අතීතයේ පටන් ලෝක ප්‍රසිද්ධ විය. ස්වාභාවික සම්පත් අතරින් මැණික් විශේෂ වන අතර, එහි ඉතිහාසය පූර්ව සියවස් ගණනක් අතීතයට විහිදේ. අතීතයේ සිට ම ශ්‍රී ලංකාව මැණික් සඳහා ලොව පුරා ඉමහත් ප්‍රසිද්ධියකට පාත්‍ර වී සිටි බව ඓතිහාසික මූලාශ්‍රවලින් පවා අනාවරණය වේ. ශ්‍රී ලංකාව "රත්නදීප" යනුවෙන් හැඳින්වීම තුළින් ම ඒ බව මනාව පැහැදිලි වේ. මහා වංශය, චූල වංශය වැනි සිංහල වංශ කතාවල ශ්‍රී ලංකා මැණික් හා මැණික් කර්මාන්තය පිළිබඳ වැදගත් තොරතුරු රැසක් සඳහන් වුණි. ක්‍රි.පූ. 3 වන සියවසට අයත් බ්‍රාහ්මීය සෙල්ලිපියක "මණිකර" (මැණික් කපන්නා) යනුවෙන් සඳහන් වීමෙන් ද මහා වංශය හා චූල වංශය වැනි සිංහල වංශ කථාවල මැණික් සම්බන්ධව " රුවන්" "මිණි" වැනි වචන බහුලව භාවිතා කර තිබීමෙන් ද අතීතයේ සිට ම මැණික් වටිනා සම්පතක් ලෙස සැලකූ බව ඓතිහාසික සාධක මඟින් පැහැදිලි වේ.

මීට අමතර ව අතීතයේ ශ්‍රී ලංකාවට පැමිණි භූගෝල විද්‍යාඥයන්, නැවියන්, දේශ ගවේශකයන් හා සංචාරකයන් ලංකාවේ මැණික් පිළිබඳ සනිටුවහන් කර ඇත. අතීතයේ සිට ම මැණික් සඳහා ලබා තිබුණු කීර්තිය විවිධ මූලාශ්‍ර පරිශීලනය කිරීමේ දී පෙනී යන විවිධ කාරණාවන් හරහා සනාථ වී ඇත. එනම් දිග් විජයෙහි ආක්‍රමණිකයන්ගේ ද, ධන ලෝභී කූට වෙළෙඳුන්ගේ ද ශ්‍රී ලංකාවේ මැණික් සඳහා ඍජුවම තර්ජන එල්ල වන්නට විය. තව ද ශ්‍රී ලංකාව විවිධ රටවල් සමඟ ගනුදෙනු, ගිවිසුම් ඇති කර ගැනීමේ දී මැණික්

ත්‍යාග භාණ්ඩ ලෙස පිළිගෙන තිබූ බව සඳහන් කළ හැකි ය. මේ අනුව ශ්‍රී ලංකාව අතීතයේ සිට ම මැණික් සඳහා ඉතා ප්‍රසිද්ධියක් ඉසිලූ බව පැහැදිලි වේ.

වර්තමානය වන විට ලෝකයෙහි රටවල් අතර පවතින මැණික් නිධි පිළබඳ අවධානය යොමු කිරීමේ දී කොළොම්බියාව, අප්‍රිකාව, මැඩගස්කරය, ශ්‍රී ලංකාව මියන්මාරය හා ඕස්ට්‍රේලියාව යන රටවල් ප්‍රධානත ම තැනක් ගනී. එබැවින් මෙවැනි රටවල ප්‍රධාන කර්මාන්තයක් ලෙස මැණික් කර්මාන්තය ක්‍රියාත්මක කරනු ලැබේ වර්තමානය වන විට ආසියානු මැණික් කර්මාන්තය රැඳී පවතින්නේ ශ්‍රී ලංකාව, ඉන්දියාව, චීනය හා තායිලන්තය යි. වර්තමානය වන විට ප්‍රධාන වශයෙන් මැණික් කර්මාන්තය පතල් කැනීම, මැණික් කැපීම හා ඔප දැමීම, ස්වර්ණාභරණ කර්මාන්තය ලෙස ප්‍රධාන කොටස් කිහිපයකට බෙදා දැක්විය හැකි ය. මෙලෙස ක්ෂේත්‍ර ගණනාවක් පුරා මෙම කර්මාන්තය ව්‍යාප්ත වී ඇති හෙයින් අතීතයට වඩා මෙම කර්මාන්තයට ජනතාවගේ අවධානය යොමු වී ඇත (http://www.justgemstone.com/blog/top-best-gemstone-countries-on-earth/).

**ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය**

වර්තමානය වන විට ලෝකයේ සැලකිය යුතු රටවල් ප්‍රමාණයක මැණික් කර්මාන්තය ප්‍රචලිතව පවතී. මෙම කර්මාන්තයේ වර්තමාන තත්ත්වය සලකා බැලීමේ දී මැණික් හමුවන ප්‍රදේශ, මැණික් අපනයනය, අපනයන වෙළෙඳපොළ, බලපත්‍ර නිකුත් කිරීම, මෙම කර්මාන්තය හා සම්බන්ධ ආයතන, සේවා නියුක්ති ස්වභාවය, කර්මාන්තය ආශ්‍රිත ගැටලු හා ඒවා අවම කිරීම යන තත්ත්වයන් වැදගත් වේ. ශ්‍රී ලංකාව තුළ පවතින ඉතා වටිනා ස්වභාවික සම්පතක්වන මැණික් සම්පත හේතුකොටගෙන බිහි වූ මානව හා භෞතික සම්පත්වලින් සමන්විත මැණික් කර්මාන්තය ශ්‍රී ලංකාවට කරනු ලබන දායකත්වය අතිමහත් ය. වැවිලි කර්මාන්තය අප රටට විශාල විනිමය සම්පතක් වීමට පෙර පටන් විදේශ විනිමය ඉපයූ සම්පතක් ලෙස මැණික්වලට හිමිවන්නේ සුවිශේෂි ස්ථානයක් වීම හේතුකොටගෙන ම අප රටෙහි ආර්ථිකය නංවාලීම විෂයෙහි මැණික් කර්මාන්තය මහඟු පිටුවහලක් වේ. ආර්ථිකයේ විවිධ අංශ ගණනාවක් පුරා මෙම කර්මාන්තය ව්‍යාප්ත වී පවතින අතර, දේශීය වශයෙන් පමණක් නොව අපනයනය සඳහා යොමු වූ කර්මාන්තයක් වීම හේතුකොටගෙන පෙර දැක් වූ පරිදි රටේ විදේශ විනිමය ඉහළ නංවා ගැනීමට හේතුවේ. තව ද මැණික් කර්මාන්තය වර්තමාන තාක්ෂණයේ දියුණුව හරහා ඉතා ඉහළ සංවර්ධනයක් ලබා තිබේ.

**මැණික් හමුවන ප්‍රදේශ**

ශ්‍රී ලංකාවේ මැණික් බිම් පිහිටීම ප්‍රධාන ගංගාවන් වන කළු ගඟ, වලවේ ගඟ, මැණික් ගඟ සහ නිල්වලා ගඟ යන ගංගා 5 ක් පාදක කරගෙන සිදුව ඇත. මැණික් කර්මාන්තයේ කේන්ද්‍රස්ථානය වශයෙන් සැලකෙනුයේ රත්නපුරය යි. කොළඹ සිට කිලෝ මීටර් 100 (සැතපුම් 63) කට දුරින් පිහිටා ඇති මේ නගරය මැණික් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන්නේ ඉතා පුරාණයේ සිට ය. රත්නපුරය හැරුණු විට ශ්‍රී ලංකාවේ මැණික් ලැබෙන වෙනත් ප්‍රදේශ ලෙස අවිස්සාවේල්ල, බලංගොඩ, ඇහැළියගොඩ, ඇලහැර, හොරණ, මහනුවර, කතරගම, මාතලේ, නිවිතිගල, නුවරඑළිය, ඔක්කම්පිටිය පැල්මඩුල්ල හා පොළොන්නරුව නම් කළ හැකි ය. තව ද ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පිහිටි

මිතියාගොඩ නම් වූ ගම පූනක්කං නම් වූ මැණික් විශේෂය සඳහා ප්‍රසිද්ධියක් උසුලයි (ආරියරත්න, 1994).

**මැණික් අපනයනය**

පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට යටත් වූ කාලසීමාවල ද දේශීයව ලද මැණික් ප්‍රධාන අපනයන භාණ්ඩයක් ලෙස විවිධ දේශ දේශාන්තරවලට යවන ලද බවත් ප්‍රකට ය. විශේෂයෙන් ම කොරන්ඩම් පවුලට අයත් අනර්ඝ මැණික් ලැබෙන දේශයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රකට වීමෙන්, වටිනාකමෙන් අධික වූ ත්, දෝෂ හා පලුදු අඩු වූ ත් මැණික් ගල් මිල දී ගැනීමට විදේශිකයන් වැඩි කැමැත්තක් දක්වයි. මෙලෙස ලෝකයේ වටිනාකමින් වැඩි ම මැණික් වර්ගවල නිජබිම වශයෙන් ශ්‍රී ලංකාව පත් වී ඇති බැවින් අප රටෙහි මැණික්වලට ඇති විදේශ ඉල්ලුම ඉහළ තත්ත්වයක පවතී. මේ හේතුවෙන් වසරක් පාසා මැණික් අපනයනයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට සැලකිය යුතු ආදායමක් ලැබේ (දසවස් සැමරුම, 2003).

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ (Gem & Jewellery Export Analaysis, 2014) වාර්ෂික වාර්තාවෙහි සඳහන් පරිදි 2005-2014 කාලය තුළ ශ්‍රී ලංකාවේ මැණික් අපනයනය වටිනාකම පිළිබඳ තොරතුරු වගුව 1 මගින් දක්වා ඇත.

වගු අංක 1: මැණික්, ගෙවුඩ, ස්වර්ණාභරණ, දියමන්ති ප්‍රති අපනයනය, දියමන්ති ස්වර්ණාභරණ හා රළු මැණික් අපනයනය සහ ප්‍රති අපනයනය (රු.මි.)

| වර්ෂය | මැණික් | ගෙවුඩ | ස්වර්ණා භරණ | දියමන්ති ප්‍රති අපනයනය | දියමන්ති ස්වර්ණාභරණ | රළු මැණික් අපනයනය සහ ප්‍රති අපනයනය |
|---|---|---|---|---|---|---|
| 2008 | 10,067 | 162 | 1,874 | 44,405 | 949 | 366 |
| 2009 | 7,226 | 108 | 1,523 | 35,966 | 417 | 186 |
| 2010 | 7,489 | 137 | 1,491 | 36,030 | 313 | 174 |
| 2011 | 10,028 | 147 | 1,732 | 45,381 | 376 | 192 |
| 2012 | 14,211 | 221 | 2,444 | 52,893 | 324 | 345 |
| 2013 | 14,245 | 119 | 2,194 | 37,885 | 229 | 393 |
| 2014 | 18,652 | 139 | 2,467 | 25,663 | 258 | 362 |

මූලාශ්‍රය-: සංඛ්‍යාලේඛණ අංශය, ජතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, 2014

මෙම සංඛ්‍යා දත්ත අනුව 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ මැණික් අපනයනය රු.මි. 14,245 ක් වූ අතර, 2014 වර්ෂයේ දී එය රු.මි. 18,652 ක් දක්වා වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය 2013 වර්ෂයට සාපේක්ෂව 23.6% ක වර්ධනයකි. මෙලෙස මැණික් අපනයනය තුළින් ශ්‍රී ලංකාවට විශාල විදේශ විනිමයක් ළඟාකර ගත හැකි වී ඇත.

1993 වර්ෂයේ දී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවීමෙන් පසුව කර්මාන්තයේ සංවර්ධනය සඳහා ගන්නා ලද යම් යම් පියවර නිසා මැණික් අපනයනය ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත. මැණික් අපනයනය කිරීම සඳහා ඇති බාධක ඉවත් කරනු වස් අධිකාරිය නව පිළිවෙතක් හඳුන්වා දී ඇති අතර, මැණික් හා ස්වර්ණාභරණ අපනයනය සඳහා 0.70% සේවා ගාස්තුවක් අධිකාරිය මඟින් අයකරගනු ලැබේ. මැණික් අපනයනයයෙන් සහ විදේශීය මුදලට මෙරට කෙරෙන වෙළෙඳාමෙන් ලැබෙන ආදායම් සඳහා යොදා ගැනෙන යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ මෙවලම් සඳහා ද ආනයනය කරන මැණික් වර්ග සඳහා ද තීරුබදු රහිතව ආනයනය කිරීමේ සහනය සහ එකතු කළ අගය මත බදුවලින් තොරව ආනයනය කිරීමේ බදු සහන ලබා දී ඇත.

තව ද දියමන්ති ආනයනය කොට කපා ඔබ දමා ප්‍රති අපනයනය කිරීමට අවසර ලැබීමත්, එම තත්ත්වය යටතේ සහ ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘති වශයෙන් කර්මාන්තශාලා දිවයිනේ විවිධ ස්ථානවල ආරම්භවීමත් සමඟ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රබල වෙනසක් ඇති වී ඇති අතර, මැණික් හා ස්වර්ණාභරණ අපනයන සංවර්ධනයේ කැපී පෙනෙන වෙනස්කම් සිදු වී ඇත. තව ද "කිම්බර්ලි ප්‍රොසෙසින් සහතිකපත්" (KIMBERLY PROCESSING SCHEME) ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව සාමාජිකත්වය ලැබීමත්, ඒ අනුව දියමන්ති කපා ඔපදමා අපනයනය කිරීමට ලැබුණු නීත්‍යානුකූල අවසරයත් ශ්‍රී ලංකා දියමන්ති අපනයන ක්ෂේත්‍රයට ලැබුණු ඉමහත් පහසුවකි. මෙවැනි තත්ත්වයන් මත මෙම කර්මාන්තයේ අපනයන තත්ත්වය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබී තිබේ (දසවස් සැමරුම, 2003).

### ශ්‍රී ලංකාව මැණික් අපනයනය කරන රටවල්

ශ්‍රී ලංකාවේ මැණික් මිල දී ගන්නා ප්‍රධාන රටවල් හා එම අපනයන ආදායම් පිළිබඳ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ (Gem & Jewellery Export Analaysis, 2014) වාර්ෂික වාර්තාවේහි සඳහන් පරිදි පහත 2 සංඛ්‍යා වගුවෙන් දැක් වේ.

වගු අංක 2 : ශ්‍රී ලංකාව මැණික් අපනයනය කරන රටවල්

| රට | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| | වටිනාකම රු.මි. | වටිනාකම රු.මි. | වටිනාකම රු.මි. | වටිනාකම රු.මි. |
| ඇමරිකා එක්සත් ජනපදය | 2,259 | 3,036 | 3,399 | 4,196 |
| තායිලන්තය | 2,318 | 3,283 | 3,181 | 3,496 |
| හොංකොං | 2,158 | 2,757 | 2,860 | 3,130 |
| චීනය | 144 | 480 | 996 | 1,651 |
| ස්විස්ටර්ලන්තය | 868 | 1,481 | 799 | 1,177 |
| සිංගප්පූරුව | 246 | 579 | 657 | 911 |
| ඉන්දියාව | 260 | 267 | 211 | 579 |


| | | | | |
|---|---|---|---|---|
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 2 | 211 | 18 | 534 |
| ප්‍රංශය | 206 | 348 | 424 | 426 |
| ඉන්දුනීසියාව | 210 | 284 | 238 | 369 |
| ජපානය | 162 | 203 | 250 | 287 |
| බෙල්ජියම | 101 | 44 | 50 | 283 |
| ජර්මනිය | 154 | 306 | 136 | 274 |
| මැලේසියාව | 204 | 176 | 232 | 250 |
| මහා බ්‍රිතාන්‍යය | 147 | 184 | 188 | 232 |
| ඉතාලිය | 279 | 140 | 120 | 216 |
| අනෙකුත් රටවල් | 310 | 432 | 486 | 641 |

මූලාශ්‍රයඃ සංඛ්‍යා ලේඛණ අංශය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

ඉහත වගු අංක 2 අනුව පැහැදිලි වන්නේ ජාත්‍යන්තර වෙළෙඳපොළේ දී ශ්‍රී ලංකාවේ මැණික්වලට වැඩි ම ඉල්ලුමක් ඇති රටවල් ලෙස ඇමරිකා එක්සත් ජනපදය, තායිලන්තය, හොංකොං, චීනය ආදී රටවල් දැක්විය හැකි ය. 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ දී ඇමරිකාවේ මැණික් ඉල්ලුම 19% කින් වැඩි වී ඇති අතර, සියලු ම රටවල් සඳහා 2013 වර්ෂයට වඩා 2014 වර්ෂයේ දී මැණික් අපනයනය වැඩි වී ඇත.

ශ්‍රී ලංකාව මැණික් අපනයනය කරන රටවල් පිළිබඳව සලකා බැලීමේ දී 2014 වර්ෂයේ දී මැණික් අපනයනය කරන ලද රටවල් හා එම රටවලට අපනයන සිදුකෙරී ඇති ප්‍රතිශතය විග්‍රහ කෙරේ.

ප්‍රස්තාර අංක 1 මැණික් අපනයනය රටවල්




මූලාශ්‍රයඃ සංඛ්‍යාලේඛණ අංශය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාව මැණික්, වැඩි ම ප්‍රතිශතයක් වූ 22% ක් ඇමරිකා එක්සත් ජනපදයට ද, 19% ක් තායිලන්තයට ද, 17% ක් හොංකොං දේශයට ද, 9% චීනයට ද, 6% ස්විස්ටර්ලන්තයට ද, 5% සිංගප්පූරුවට ද, 3% බැගින් ඉන්දියාවට හා එක්සත් අරාබි එමීර් රජ්‍යයට ද 2% ප්‍රංශයට සහ ඉතිරිය 101 ක් වූ සෙසු රටවලට ද අපනයනය කර ඇත.


## මැණික් කර්මාන්තය හා සේවා නියුක්තිය

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටකි. එමෙන් ම රටේ ආර්ථිකයට ඔරොත්තු නොදෙන ජනගහනයකින් යුක්ත වේ. පුද්ගලයින් අතර සේවා වියුක්තිය ග්‍රාමීයව හා නාගරිකව බොහෝ සෙයින් දැක ගත හැකි ය. ග්‍රාමීය වශයෙන් දැකිය හැක්කේ වාරික සේවා වියුක්තිය හා ඌණ සේවා නියුක්තිය යි. විශේෂයෙන් ම ඌණ සේවා නියුක්තිය තුළ සිටින සේවා වියුක්තිකයන් නුපුහුණු ශ්‍රමිකයන් නිසා ආර්ථික වශයෙන් වැදගත් ශ්‍රම හමුදාවක් නොවේ. මෙම නුපුහුණු ශ්‍රමය ඵලදායි ලෙස සේවා නියුක්ත කර ජාත්‍යන්තර ආර්ථිකයට සම්බන්ධ කළ හැකි මාර්ගයක් ලෙස මැණික් කර්මාන්තය ඉතා වැදගත් වේ. මැණික් කර්මාන්තය නිසා සෘජු හා වක්‍ර රැකියා රාශියක් බිහි වීම දක්නට ලැබේ. මැණික් පතල් කම්කරුවන්, පතල් හිමියන්, මැණික් ව්‍යාපාරිකයන්, ගෙවුඩ පුළුස්සන්නන් සහ මැණික් කපන්නන් හා ඔප දමන්නන් සෘජුවම මැණික් කර්මාන්තය හා සම්බන්ධව රැකියාවන් කරයි. මෙම පිරිසට අමතරව බොහෝ පිරිසක් අතරමැදියන් ලෙස කටයුතු කරනු ලැබේ.

## මැණික් කර්මාන්තය ආශ්‍රිත ආයතන

මැණික් කර්මාන්තය ඈත අතීතයේ සිට අද දක්වා ම පැමිණීම සඳහා විවිධ ආයතනවල මගපෙන්වීම, සහය නොබඳව ලැබුණි. මැණික් කර්මාන්තයේ ප්‍රගතිය සහ අභිවෘද්ධිය උදෙසා 1971 අංක 13 දරණ පනත අනුව එවකට පැවති රාජ්‍ය විසින් රාජ්‍ය මැණික් සංස්ථාව පිහිටුවන ලදී. මෙම ආයතනය මඟින් කර්මාන්තයේ අවශ්‍යතාවන් සොයාබලා ඉටුකරන ලදී. එම ආයතනය සතු බලතල හා වගකීම් කර්මාන්තයේ සංවර්ධනය උදෙසා යොදවා තිබූ නමුත් තත්කාලීන ව්‍යුහාත්මක වෙනස්කම් ද සැලකිල්ලට ගෙන සම්පූර්ණ ක්ෂේත්‍රයේ සංවර්ධනය අරමුණු කරගත් නව ආයතනයක් ලෙස පුළුල් බලතල ඇතිව 1993 අංක 50 දරණ පාර්ලිමේන්තු පනතින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පිහිටවන ලදී. මෙම කර්මාන්තයේ ප්‍රගතිය අරමුණු කොට ගනිමින් විවිධ ආයතනයන් කාලානුරූපීව බිහිවීම හේතුකොට ගනිමින් පෙරට වඩා තත්ත්වයෙන් උසස් ලෙස මැණික් කර්මාන්තය ජාත්‍යන්තරය කරාගෙන යාමට හැකි වී තිබේ. මේ අනුව මැණික් කර්මාන්තය හා සෘජුව ම ගණුදෙනු කරනු ලබන ආයතන පහත දැක්වේ.

ගැලීම් සටහන 3.1 මැණික් කර්මාන්තය ආශ්‍රිත ආයතන




මූලාශ්‍රයඃ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, 2011.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය මැණික් කර්මාන්තය හා සම්බන්ධ ප්‍රධාන ආයතන වන අතර, වර්තමානයේ කර්මාන්තයේ ප්‍රගමනය උදෙසා මහඟු දායකත්වයක් උසුලයි. තව ද ජාතික මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය යටතේ පවතින ප්‍රදේශීය කාර්යාල හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ සහ අභ්‍යාස ආයතන හරහා මැණික් කර්මාන්තය සංවර්ධනය වේ.

## මැණික් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළව බලපත්‍ර නිකුත් කිරීම

ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය තුළ විවිධ අංශයන්ට අදාළ බලපත්‍ර නිකුත් කිරීමේ හැකියාව පවතින්නේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට යි. පුද්ගලයින් මැණික් කර්මාන්තය තුළ නීතිමය වශයෙන් මෙන් ම අනවසරයෙන් ද සේවා නියුක්ත වී සිටීම දැක ගත හැකි ය. කෙසේ නමුත් බලපත්‍ර සහිතව මැණික් කර්මාන්ය තුළ නියලීම වඩා වැදගත් වේ. පහත දැක්වෙන වගු අංක 3 මගින් පෙන්නුම් කරනුයේ මෑතකාලීනව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණයන් ය.

වගුව අංක 3: ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර (ඒකක)

| වර්ෂය | මැණික් ගැරීමේ බලපත්‍ර | මැණික් වෙළෙඳ බලපත්‍ර | මැණික් කැපුම් බලපත්‍ර | මැණික් වෙන්දේසි |
|---|---|---|---|---|
| 2009 | 3970 | 3996 | 174 | 217 |
| 2010 | 4061 | 4195 | 168 | 262 |
| 2011 | 4687 | 4422 | 179 | 277 |
| 2012 | 5956 | 4382 | 177 | 365 |
| 2013 | 6565 | 4429 | 192 | 624 |
| 2014 | 5928 | 4714 | 199 | 578 |

මූලාශ්‍රයඃ සංඛ්‍යාලේඛණ අංශය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, 2014

ජාතික මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය මඟින් වාර්ෂිකව මැණික් වෙළෙඳ බලපත්‍ර හා මැණික් කැපුම් බලපත්‍ර වල නිකුත් කිරීමේ වර්ධනයක් දැක ගත හැකි ය. නමුත් 2014 වර්ෂයේ දී 2013 වර්ෂයට සාපේක්ෂව 10.7% කින් අඩු වී ඇති අතර, මැණික් වෙන්දේසි බලපත්‍ර නිකුත් කිරීම 8% කින් අඩු වී ඇත.

**මැණික් කර්මාන්තය ආශ්‍රිත ගැටලු හා ඒවා අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග**

මැණික් කැණීම නිසා ඇතිවන පාරිසරික බලපෑම අති විශාල ය. කොතරම් ආර්ථික හා සමාජීය වාසි අත්කර දුන්න ද, මැණික් කැණීම ඉතා පරිසර හානිදායක ක්‍රියාවලියකි. මතුපිට විශාල වලවල් හැරීම, ගං ඉවුරු කැඩීයාම, මහා මාර්ග යටින් පවා පොළව අභ්‍යන්තරයේ දෝනා කැනීම සහ ඉල්ලම් සේදීම සඳහා ජල මාර්ග පරිහරණය නිසා ජලය අපවිත්‍ර වීම වැනි පාරිසරික හානි ජනාධික කුඩා දිවයිනක භූමි හා ජල සම්පත්වලට දැරිය නොහැකි තරම් ය.

මැණික් පතල් කැනීම නිසා වර්තමානයේ ඇති වී තිබෙන ප්‍රධාන ගැටලු ලෙස පාංශු ඛාදනය හා අවසාදිත තැන්පත් වීම, ගංගා ආශ්‍රිත ඉවුරු කැඩී විනාශ වීම,භූගත හා භූගත ජල මූලාශ්‍ර විනාශ වී යාම, පසේ සාරවත් බව අඩු වීම, ජල මූලාශ්‍රවල ජල ධාරිතාව අඩුවීම නිසා ගංවතුර ඇති වීම, වාරිමාර්ග කාර්යක්ෂමතාව අඩු වීම, වනාන්තර හා වෘක්ෂලතා විනාශ වීම හා වන ජීවීනට වන බලපෑම, ජල මූලාශ්‍ර දූෂණය වීම නිසා ජලය මිනිස් පරිභෝජනයනට භාවිතා කළ නොහැකිවීම, මානව සෞඛ්‍යට බලපෑම් එල්ලවීම, වසා නො දැමූ පතල් ආශ්‍රිතව මදුරුවන් බෝවීම, රජයේ සහ පෞද්ගලික දේපලවලට හානි සිදු වේ.

මැණික් කර්මාන්තයෙහි ප්‍රධාන අංශයක් වන මැණික් කැණීම් හේතුකොටගෙන ඇතිවන ඉහත ගැටලු අවම කිරීමෙහිලා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. ඒවා නම්, පරිසර හිතකාමී කැනීම් හා ගැරීම් ක්‍රමවේදයක් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම, බලපත්‍ර ලබාදෙන මැණික් පතලක් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශවලට අනුකූලව බලපත්‍ර ලබාදීම හා නිරන්තරයෙන්

අධීක්ෂණ කටයුතු සිදු කිරීම, ගංගා ඇළ දොළ ආශ්‍රිත පතල් කැපීම මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශවලට, අනුකූලව බලපත්‍ර ලබාදීම හා නිරන්තරයෙන් අධීක්ෂණ කටයුතු සිදු කිරීම, පාරිසරික සංවේදී කලාපයන්හි කැණීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ජාතික පාරිසරික පනත අනුකූලව පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය සිදු කිරීම, නො වැසූ පතල් වළවල් විධිමත් පරිදි වසා ඉඩම් යථා තත්ත්වයට පත් කිරීම, මැණික් කැණීමෙන් විනාශ වූ ගං ඉවුරු සකස් කිරීම හා රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පරිසර හිතකාමී ලෙස පතල් කැණීම් සිදු කරන ආකාරය පිළිබඳව පාසල් සිසුන් පතල් කාර්මිකයන් හා මැණික් කර්මාන්තයේ යෙදී සිටින්නන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු සංවිධානය කර ක්‍රියාත්මක කිරීම, මැණික් පතල් වැඩ හවුල්කරුවන් සහ ස්වර්ණාභරණ කාර්මික ශිල්පීන් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වා සහතිකපත් හා හැඳුනුම්පත් ලබාදීම, අනවසර කැණීම් පාලනය හා නීත්‍යානුකූල කැනීමේ ක්‍රමවේදයන් දිරිගැන්වීම සඳහා බලපත්‍රලාභී පතල්කරුවන් වෙත හදිසි අනතුරු වන්දි ප්‍රධානය කිරීම, පාංශු ඛාදනය පාලනය කිරීම හා පාංශු සංරක්ෂණ වැටි, මඩ රඳවනයක්, මඩ පෙරණයක් (Sediment silt traps) වැනි තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම සඳහා පතල්කරුවන් පුහුණු කිරීම හා ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම ආදී ක්‍රියාමාර්ග වේ (පරිසර හිතකාමී මැණික් ගැරුම් ක්‍රමවේදයක් කරා, 2012).

**මැණික් කර්මාන්තයේ අනාගතය**

වර්තමානයේ දී මැණික් කර්මාන්තය තුළ අධික ලෙස යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම දැක ගත හැකි අතර, ඒ තුළින් විශාල පාරිසරික හානියක් සිදු වන අතර ඒවා අවම කිරීමෙහිලා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වැදගත් කාර්යයභාරයක් ඉටු කරනු ලබයි. නමුත් මැණික් කර්මාන්ත ව්‍යුහය තුළට අධි තාක්ෂණය අනුගත කළහොත් දැනට සිදුවන පාරිසරික හානි නිසා අනාගතයේ දී විවිධ දරුණු ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවිය හැකි ය. තව ද කෘත්‍රිම හා ව්‍යාජ මැණික් ගල් නිසාත් පුළුස්සන ලද ගෙවුඩ නිසාත් ශ්‍රී ලංකාවේ කීර්තිමත් මැණික් කර්මාන්තයට හානි පැමිණිය හැකි ය. මේ තත්ත්වයන් සලකා බැලීමේ දී සඳහන් කළ යුත්තේ ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය වඩාත් යුක්ති සහගත පදනමක් මත සංවිධානය කිරීම පෙරදැරි කරගෙන අනාගතය සැලසුම් කළ යුතු වේ.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ මැණික් සඳහා දිගු ඉතිහාසය පවතින අතර, මැණික් කර්මාන්තය සඳහා සුවිශේෂී ස්ථානයක් ලැබී ඇත. අප රටෙහි සෑම බිම් ප්‍රදේශයකින් ම මැණික් නොලැබෙන අතර, ඒ සඳහා ප්‍රසිද්ධ ස්ථාන පවතී. ලෝකය තුළ අප රටෙහි මැණික් සඳහා ඇත්තේ ඉහළ ඉල්ලුමකි. එබැවින් මැණික් අපනයනය තුළින් සැලකිය යුතු විදේශ විනිමයක් වාර්ෂිකව උපයාගත හැකි වී ඇත. මැණික් කර්මාන්තය තුළ පුද්ගලයින්ට බොහෝ සේවා නියුක්ති අවස්ථා පවතින නිසා එහි සේවා නියුක්තවීමෙන් ආර්ථික වාසි අත්කර ගැනීමට හැකි වී ඇත. මැණික් කර්මාන්තයේ ප්‍රගමනය උදෙසා බොහෝ ආයතන ස්ථාපනය කර ඇති අතර, එම ආයතන මැණික් කර්මාන්තය තුළ සංවර්ධනයක් ඇති කිරීම මූලික අරමුණ බවට පත්කොටගෙන ඇත. මෙම කර්මාන්තය ආශ්‍රිත ව යම් යම් ගැටලු දැක ගත හැකි අතර, ඒවා අවම කිරීමෙහිලා විවිධ ආයතනික ක්‍රියාමාර්ග

ගෙන ඇත. එම ක්‍රියාමාර්ග අනුගමනය කරමින් මැණික් කර්මාන්තය තුළින් තවදුරටත් වාසි අත්පත් කරගැනීම තුළින් ආර්ථික වර්ධනයක් ඇතිකර ගත හැකි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ආරියරත්න ඩී.එච් (2010), *''ශ්‍රී ලංකාවේ මැණික්''*, කතෘ ප්‍රකාශනයකි.

*''දසවස් සැමරුම''* (2003), ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (2012), *''පරිසර හිතකාමී මැණික් ගැරුම් ක්‍රමවේදයක් කරා''* , ගොල්ෆේස් ටෙරස්, කොළඹ 03.

මැණික් හා ස්වර්ණාභරණ අපනයන විශ්ලේෂණය (2013), ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ගොල්ෆේස් ටෙරස්, කොළඹ 03.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (2011), *''ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සහ මැණික් කර්මාන්තයේ ප්‍රගතිය''*, ගොල්ෆේස් ටෙරස්, කොළඹ 03.

Justgemstone, *“Top Best Gemstone countries on earth”*, http://www.justgemstone.com/blog/top-best-gemstone-countries-on-earth, viewed on 10 November 2015.